ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

මාධ්‍ය නිවේදනය

**ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් මාධ්‍ය රෙගුලාසි සඳහා වන යෝජනා ජනමාධ්‍ය අමාත්‍යංශයට ඉදිරිපත් කරයි.**

ශ්‍රී ලංකාවේ මාධ්‍ය නියාමන යාන්ත්‍රණයක් සඳහා වන යෝජනාවල දළ සැළැස්මක් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ ඊට අනුබද්ධ සංවිධාන විසින් පසුගිය 2021 මාර්තු 15 දින ජනමධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා වෙත භාර දෙන ලදී. ස්වයං නියාමන මුලධර්ම මත පදනම් වූ යෝජිත මාධ්‍ය අධිකාරියට මුද්‍රිත,විකාශන සහ ඩිජිටල් මාධ්‍යද ඇතුලත් වේ.

අමාත්‍යවරයා හමුවූ එම නියෝජිත කණ්ඩායමට ශ්‍රී ලංකා පුවත්පත් හිමිකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය, දෙමළ මාධ්‍ය සන්ධානය, මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය, දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සංගමය - ශ්‍රී ලංකා පාර්ශ්වය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ නියෝජිතයෝ ඇතුළත් වූහ.

යෝජිත මෙම නව යාන්ත්‍රණය ඔස්සේ 1973 අංක 5 දරණ පුවත්පත් මණ්ඩල පනත අහෝසි කිරීම මෙන්ම 1996 යේ අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත, 1982 සංශෝධිත අංක 6 දරණ ශ්‍රී ලංකා රූපවාහිනි පනත,1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත,1839 අංක 5 දරණ ශ්‍රී ලංකා පුවත්පත් ආඥා පනත යන පනත් වල සංශෝධන ද ඇතුළත් වේ.

යෝජිත අධිකාරිය ජනමාධ්‍ය ක්ෂෙත්‍රයේ සහ රාජ්‍ය මාධ්‍ය නියෝජිතයන් සහ මූල්‍ය, නීතිය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා නව මාධ්‍ය යන ක්ෂෙත්‍රයන් වල විශේෂඥයන්ගෙන් සමන්විත වේ. වර්තමාන මාධ්‍ය වෘත්තීය මේ ඔස්සේ කළමනාකරණය සහ නියාමනයට ලක් කරනු ඇත. යෝජිත අධිකාරිය මාධ්‍ය ආචාරධර්ම සහතික කිරීම. පැමිණිලි සම්බන්ධයෙන් සහ සිය නිරීක්ෂණ මත විමර්ශන

**96, Kirula Road, Colombo 05. Tel: +94-11-5353635 Fax: +94-11-5335500**
**Web: www.slpi.lk, Email: info@slpi.lk, : Sri Lanka Press Institute, Twitter: @SLPI**

පැවැත්වීම,විකාශනය බලපත්‍ර කිකුත් කිරීම, නියාමනයට ලක් කිරීම අදාල ගාස්තු පැනවීම, සුදුසු දණ්ඩන සහ සම්බාධක පැනවීම අධිකාරිය විසින් සහතික කළ යුතුය.

පැමිණිලි සහ නිරීක්ෂණ මත සමථකරණය මැදිහත්කරණය සහ බේරුම්කරණ ක්‍රියාවලිය ඔස්සේ විමර්ශන සිදු කරනු ලබයි. බේරුම්කරණ ක්‍රියාවලිය 1995 අංක 11 දරන බේරුම්කරණ පනතට අනුකූල වේ. එමෙන්ම අධිකාරිය විසින් දෙනු ලබන ඕනෑම නියෝගයක් අභියාචනාධිකරණයේ අභියාචනා කළ හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ  අදාළ පාර්ශ්වකරුවන්ගේ මෙම දායකත්වය මහජනයාට සහ මාධ්‍යට එලදායි බව අමාත්‍යවරයා වැඩිදුරටත් පැවසීය.

# Photo

ජනමාධ්‍ය අමාත්‍ය ගරු.කෙහෙළිය රඹුක්වැල්ල,මහතා සමග මේ පිළිබව පැවැති සාකච්ඡාවට  කුමාර් නඩේසන්, සභාපති ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ ශ්‍රී ලංකා පුවත්පත් හිමිකරුවන්ගේ සංගමය නියෝජනය අමාත්‍යවරයාගේ දකුණු පැත්තේ අසුන්ගෙන සිටී. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ කුමාර් ලෝපේස්, ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ, කුමාර් ලෝපේස්, සිරි රණසිංහ, කාංචන දසනායක යන මහත්වරු ද, නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කරු සීතා රංජනී මෙනවිය, දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සංගමයෙ ශ්‍රී ලංකා පාර්ශ්වය ලක්ෂ්මන් ගුණසේකර, ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය, දෙමළ මාධ්‍ය සන්ධානය නියෝජනය -එන්.එම් අමීන් සහ මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනයේ - ධර්මසිරි ලංකාපේලි - යන මහත්වරු සහභාගී වූහ.